# 03 අප මහ බෝසතුන්ගේ අවසන් උපත සිදු වූ වගයි

ජම්බුද්වීපය හෙවත් දඹදිව යනු අප අසල්වැසි රට වන ඉන්දියාවට යෙදුණු පැරණි නාමය යි. එහි අද උතුරු ඉන්දියාවට අයිති මධ්‍ය දේශයේ ශාක්‍ය නම් ජනපදයක් විය. එහි අගනුවර වූයේ රෝහිණී ගඟබඩ පිහිටි කපිලවස්තු හෙවත් කිඹුල්වත් නුවර යි. මේ අවධියේ එහි රජකම් කළේ සුද්ධෝදන මහ රජතුමා ය. එතුමාගේ අග බිසව වූයේ මහාමායා දේවිය යි.

## ඇසළ සැණකෙළිය


ඇසළ පුන් පෝ දිනය පැරණි දඹදිව උත්සව, සැණකෙළි, පෙරහර ආදිය පැවැත්වෙන දිනයකි. ඒ දිනට සතියකට පෙර සැණකෙළි ඇරඹේ. එය අවසන් වන්නේ පෝද පැවැත්වෙන මහා උත්සවයකිනි. කිඹුල්වත් නුවර ද එකල ඇසළ උළෙල මහා ඉහළින් පැවැත්විණ.

## අපූරු සිහිනය

මහාමායා දේවිය දින හතක් පුරා උත්සව සිරි වින්දා. සත්වන ද උදෑසන පිබිදී, සුවඳ පැනින් නා, දවස පුරා පෙහෙවස් සමාදන් වී, මහා දන් දෙමින් කල් ගෙව්වා ය. රාත්‍රියෙහි නින්දට ගිය එතුමියට මෙබඳු සිහිනයක් පෙනිණ.

සතර වරම් දෙවිවරු ඇය සයනය පිටින් ම ඔසවාගෙන හිමාලයට ගෙන ගියහ. එහි සිරියල් ගල්තලාවක් මත මහා සල්රුකක් යට සයනය තබා ඔවුහු පසෙකට වූහ. අනතුරු ව ඔවුන්ගේ අග බිසෝවරු සතර දෙනා මහාමායා දේවිය අනවතප්ත විලට ගෙන ගොස් නහවා, දිවසළු හඳවා, සුවඳ විලවුන් ගැල්වූහ. එම විල අසල රිදී පර්වතයක් තුළ රන් විමනක් විය. ඒ තුළ පෙරදිගට හිස ලා දිව්‍යමය යහනක් පනවා දේවිය එහි සතපවන ලදී. මේ මොහොතේ සුදු ඇත් පැටියෙක් අසළ වූ රන් පර්වතයක ඇවිද එයින් බැස රිදී පර්වතයට නැගී

උතුරු දෙසින් දේවිය වෙත පැමිණියේ ය. සුදු නෙළුමක් සොඬින් ගත් ඇත් පැටියා කුංචනාද කොට රන් විමනට පිවිස මව් යහන වටා තෙවරක් පැදකුණු කොට දකුණු ඇලයෙන් ඇගේ කුසට පිවිසියේ ය. ඒ මොහොතේ උතුරුසල නම් නැකත උදා වී තිබුණි. ඒ මහා බෝසතාණන් වහන්සේ තුසිත දෙව් ලොවින් චුත වී මව්කුස පිළිසිඳ ගැනීම යි. ඒ මොහොතේ දස දහසක් සක්වල කම්පා විය. මහා ප්‍රීති ඝෝෂාවක් පැතුරුණි. සක්වල අසිරිමත් සිදුවීම් රැසක් ම සිදු විය.



පසුදින උදෑසන මහාමායා දේවිය සුදොවුන් රජතුමාට ඒ සිහිනය ගැන දන්වා සිටියා ය. රජතුමා උගත් බමුණන් හැට හතර දෙනෙකු මාළිගාවට කැඳවා ගරු සරු ඇතිව වඩා හිඳුවා රසමසවුළෙන් සංග්‍රහ කළේ ය. ඉන්පසු සිහිනය ගැන දන්වා එහි ඵලවිපාක කෙසේ වේ දැයි විමසා සිටියේ ය. එවිට බ්‍රාහ්මණවරු;

"මහරජ බිය නොවනු මැනවි. ඔබගේ දේවියගේ කුස දරු ගැබක් පිළිසිඳගෙන ඇත. ඔහු උතුම් පුත් රුවනකි. ඒ පුත් රුවන ගිහි ගෙහි සිටියහොත් සක්විති රජ වන්නේ ය. පැවිදි වුවහොත් බුදුවන්නේ යයි." කියා සිටියෝ ය.

එතැන් සිට අප මහ බෝසතාණෝ මව්කුස තුළ සුවසේ වැඩුණහ. දේවිය ද කිසිදු රෝග පීඩාවකින් තොරව සුවෙන් කල් ගෙව්වා ය.

## මහාමායා දේවිය මව්පියන් වෙත යයි.

දරු ගැබට දස මසක් පිරෙන්නට ළං වෙද්දී මහාමායා දේවියට තම මව්පියන් දකින්නට දෙව්දහ නුවරට යන්නට සිත් විය. ඒ බව සුදොවුන් රජුට සැළකළ විට එතුමා කිඹුල්වත් නුවර සිට දෙව්දහ නුවර දක්වා මග දෙපස සරසවා මහ පෙරහරින් ඇය පිටත් කර යැවී ය.

## ලුම්බිණි සල් උයනේ අසිරිය

මේ නගර දෙක අතර ලුම්බිණි නම් සල් උයනක් තිබුණි. ඒ වෙසක් සමයේ උයනේ ගහකොළ මලින් පිරී පලබරවී නැවුම් සිරියක් ඉසිලී ය. මල් රොන් ගන්නා බඹරුන්ගේ ගුමු ගුමු නාදයෙන් ද ගසින් ගසට සැරි සරන කුරුල්ලන්ගේ කිචි බිචි හඬින් ද අවට පරිසරය අපූරු සිරියක් දැරී ය. මේ සොඳුරු උයන් සිරි දුටු මහාමායා දේවියට උයනට යාමට ආසාවක් ඇති විණ. ඒ බව දැනගත් ඇමතිවරු දෝලාව පිටින් ම දේවිය සල් උයනට කැඳවාගෙන ගියහ. රන්සිවි ගෙයින් බිමට බැස්ස මහාමායා දේවිය උයනේ සිරි විඳ විඳ රජපවුලේ උදවියට වෙන්වුණු මගුල් සල් රුක අබියසට පැමිණියා ය. ඕතොමෝ එහි පෙරදිග බලා සිටගෙන දකුණතින් මලින් පිරි සල් අත්තක් අල්වා පහතට නවා ගත්තා ය. මොහොතකින් දේවියට දරුවෙකු බිහිවීමේ ප්‍රසව වේදනාව දැනෙන්නට විය. ඒ බව වටහාගත් ඇමතිවරු සල්ගස් වටා තිර ඇද්දේ ය. බෝසත් කුමරු බිහිවන මොහොත උද විය. වෙනත් දරුවන් බිහිවන විට මවුකුසින් පළමුව බිහිවන්නේ හිසයි. එහෙත් බෝසත් කුමරු අත් පා දිග හැර ධර්මාසනයකින් බසින ධර්ම කථිකයෙකු සේ මව් කුසින් බිහි විය. පළමුවෙන් ම බ්‍රහ්මයෝ සතරදෙනෙක් රන් දැලකින් කුමරු පිළිගත්හ. ඔවුනතින් සතරවරම් රජවරු අතටත් ඔවුන්ගෙන් ඇමතිවරු අතටත් පත් විය. ඔවුන් අතින් බිමට බට කුමරු සදිසාව ම හොඳින් බලා අන්තිමේ දී උතුරු දිශාව බලා පියුම් පිට සත් පියවරක් ඉදිරියට ගමන් කළේ ය. මහා බ්‍රහ්මයා එතුමාට සේසත් දැරී ය. සත්වන පියවර තබා සිටගත් කුමරු,

''අග්ගෝ හමස්මි ලෝකස්ස
ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස
සෙට්ඨෝ හමස්මි ලෝකස්ස
අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ''

"මම ලොවට අග්‍ර වෙමි.
මම ලොවට ජ්‍යෝෂ්ඨ වෙමි.
මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි.
මේ මගේ අවසාන උපත යි.
මාගේ මින් මතු ඉපදීමක් නැත."



යන අභීත සිංහ නාදය කළේ ය. ඒ මොහොතේ ලොව පුරා පෙරනිමිති දෙතිසක් පහළ විණි. එතුමා ලොවට බිහිවන මොහොතේ ම යශෝධරා දේවිය, ඡන්න ඇමති, කාලුදායි ඇමති, අජානීය හස්තිරාජයා, කන්ථක අශ්වයා, මහාබෝරුක සහ සතර මහා නිධාන පහළ විය. අනතුරු ව කිඹුල්වත් නුවර හා දෙව්දහ නුවර ඥාති පිරිස මහත් සොම්නසට පත් ව මහා පෙරහරින් දේවියත් බෝසත් කුමරුත් ආපසු කිඹුල්වත් නුවර රජමාළිගාවට කැඳවාගෙන ගියෝ ය.

## ක්‍රියාකාරකම 3.1

"අ" කොටසේ කරුණු සම්බන්ධතාව අනුව "ආ" කොටසට ඉරකින් යා කරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. මහාමයා දේවිය උපත ලද නගරය | රෝහිණී ය. |
| 2. මව් කුසින් බිහිවුණු සිදුහත් කුමරු පළමුව පිළිගත්තේ | හිමාලයේ ය. |
| 3. ශාක්‍ය ජනපදය පිහිටියේ ඉන්දියාවේ | ජම්බුද්වීපය යි. |
| 4. කිඹුල්වත්පුරය අසල පිහිටි නදිය | ලුම්බිණිය යි. |
| 5. ඇතෙකු නාද කරන හඬ | බ්‍රහ්මයන් ය. |
| 6. අනවතප්ත විල පිහිටියේ | ඇසළ. |
| 7. ඉන්දියාවට අතීතයේ භාවිත කළ නම | බෝසතාණන් ය. |
| 8. සල් උයනක් ලෙස ප්‍රසිද්ධ වූයේ | දෙව්දහ ය. |
| 9. දඹදිව එද පැවති අසිරිමත් උත්සවයකි | කුංචනාදය යි. |
| 10. මහාමායා දේවිය දුටු සිහිනයේ සුදු ඇත් පැටවාගෙන් පෙන්වූයේ | මධ්‍ය දේශයේ ය. |

### ජීවිතයට ඔවදනක්

**න පරෙසං විලොමානි**
**න පරෙසං කතාකතං**
**අත්තනොව අවෙක්ඛෙය්‍ය**
**කතානි අකතානිච**

අනුන් කී නොකී දේ හා කළ
නොකළ දේ නො සොයන්න.
තමන් කී නොකී හා කළ
නොකළ දේ පමණක් සොයන්න.



නොමිලේ බෙදා හැරීම පිණිසයි.